# කොවිඩ් 19 - සති පාසල 10 ශ්‍රේණිය

## 10 වන පාඩම - ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර
කෑ / දෙහි කිතලංගමුව ක . වි

- නිපුණතාවය - රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරින් විමර්ශනය කරයි.
- නිපුණතා මට්ටම - 10 . 1 තාක්ෂණික ආධිපත්‍යය හා තාන්ත්‍රික උපක්‍රම මඟින් පෘතුගීසීන් හා ලන්දේසීන් බලය ව්‍යාප්ත කළ ආකාරය පහදයි.
- විෂය සන්ධාරය - ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය
- ඉගෙනුම් ඵල -
  - ❖ පෘතුගීසීන් හා ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවාගත් ආකාරය පැහැදිලි කරයි.
  - ❖ පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට මෙරට දේශපාලන තත්වය පැහැදිලි කරයි.
  - ❖ විදේශිකයින්ගේ බල ව්‍යාප්තිය හමුවේ ලාංකිකයන්ගේ ප්‍රතිරෝධතා විස්තර කරයි.
- පෘතුගීසීන් හා ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවාගත් ආකාරය පැහැදිලි කරයි.

(3) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

දුවේ පුතේ ඔබ 8 ශ්‍රේණියේ දී සහ 9 ශ්‍රේණියේ දී ශ්‍රී ලංකාවේ පෘතුගීසි හා ලන්දේසි පාලන සමය පිළිබඳව අධ්‍යනය කරනු ලැබූහ. අද අපි මෙම පාඩමෙන් ඒ පිළිබඳව තව දුරටත් අධ්‍යනය කරමු. ඔබ කලින් ශ්‍රේණිවල දී ඉගෙනගත් කරුණු ද සමග සංසන්දනය කරමින් එම දැනුම හා අවබෝධය තව දුරටත් පුළුල් කර ගැනීමට මෙම පාඩමේ ඇති තොරතුරු ද උපයෝගී කර ගන්න.

ඒ අනුව ඔබ ලබා ගත් දැනුම උපයෝගී කර ගනිමින් 10 ශ්‍රේණියේ පෙළපොත හොඳින් අධ්‍යනය කර පහත ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

(1) පෘතුගීසීන් උඩරට රාජධානිය කෙරෙහි සිය අවධානය යොමු කිරීමට බලපෑ හේතු මොනවා ද?

(2) පෘතුගීසීන් උඩරට රාජධානිය අත්පත් කරගැනීම සඳහා උත්සහ කළ අවස්ථා පිළිබඳ තොරතුරු ඇතුලත් කරමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සටනේ නම | වර්ෂය | පෘතුගීසි සෙන්පතියා | උඩරට පාලකයා | සටනේ ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**(3) පෘතුගීසීන් උඩරට රාජධානිය යටත් කරගැනීමට නොහැකි වූ හේතු මොනවාදැයි ලියා ඉන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.**

**(4) පහත සඳහන් ස්ථාන ලෝක ස්ථාන ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.**

**මහනුවර , කොළඹ , මුල්ලේරියාව , සීතාවක , රයිගම , බලන , දන්තුරේ , රන්දෙණිවෙල , ගන්නොරුව , නල්ලූර් , මල්වාන**

- **ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කරගත හැකි පොත්පත් , වෙබ් අඩවි සහ ඉගෙනුම් ආධාරක**

  **දුවේ , පුතේ පහත පොත් පත් හා වෙබ් අඩවි පරිශීලනය කිරීමෙන් ඔබට මෙම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.**

1) e - තක්සලාව
2) e - නැණ පියස - http:/ www. enenapiyasa.lk
3) You tube නාලිකාවේ ශ්‍රී ලංකාවේ පෘතුගීසි හා ලන්දේසි පාලනයට අදාල මාතෘකා ඔස්සේ ඇති ඇති තොරතුරු , රූප සටහන් සහ සිතියම්.
4) පොත්පත් -

   8 , 9 සහ 10 ශ්‍රේණිය පෙළපොත් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

   අ . පො . ස ( උ . පෙළ ) ශ්‍රී ලංකා ඉතිහාසය III කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

   ශ්‍රී ලාංකිය ඉතිහාසය III වෙළුම - ඇම් . ඩී . ගුණසේන සහ සමාගම

   ලංකාවේ ලන්දේසි බලය - ආචාර්ය එස්. අර්සරත්ගම්

   ශ්‍රී ලංකාවේ ලන්දේසි බලය පිහිටුවීම - ආචාර්ය කේ . ඩබ් . ගුණවර්ධන